# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/63 - 2022 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2022.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(අ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද 2005 ජූලි මස 08 වැනි දින අංක 1400/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (කලින් කලට සංශෝධිත පරිදි වූ) පළ කරන ලද නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දැක්වෙන "නර්තන හා නාට්‍ය කලා පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන "ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය" යන අයිතමයට ඉක්බිතිව ම (2021 මාර්තු මස 01 වන දින අංක 2217/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන සටහන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය."

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0182


1A - PG 5934 — 457 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*